**පොදු ප්‍රවාහනයේ දී කාන්තාවන්ට සිදුවන ලිංගික හිංසන වැලැක්වීම පිළිබඳව**

**අදාළ පාර්ශවකරුවන් සමඟ වූ ප්‍රතිපත්තිමය සාකච්ඡාව**

දෙවන කාර්තුවට අදාල පොදු ප්‍රවාහනයේ දී සිදුවන ලිංගික හිංසන පිළිබඳ අදාළ පාර්ශවකරුවන් සමඟ ප්‍රතිපත්තිමය සාකච්ඡාව 2019 මැයි මස 30 වන දින කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශයේ ජාතික කාන්තා කමිටුවේ දී පෙ.ව. 10.00ට පැවැත්වුණි. මෙම සාකච්ඡාව ජාතික කාන්තා කමිටුවේ සභාපති ස්වර්ණා සුමනසේකර මහත්මිය සහ විධායක අධ්‍යක්ෂ එම්.ඒ. අනුලා ඉන්ද්‍රානි මහත්මිය යන අයගේ මූලිකත්වයෙන් පැවැත්වුණු අතර ඒ සඳහා ශ්‍රී ලංකා පොලිසිය, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, පොලිස් ළමා හා කාන්තා කාර්යාංශය, ජාතික ගමනාගමන කොමිසම සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව යන රාජ්‍ය ආයතන මෙන්ම රාජ්‍ය නොවන ආයතනවල නිලධාරින් ද සහභාගී විය. මෙම සාකච්ඡාවේදී පොදු ප්‍රවාහන ක්ෂේත්‍රයේ සිදු වන හිංසනයන් අවම කිරීම උදෙසා ක්‍රියාත්මක කරන වැඩසටහන් පිළිබඳ සාකච්ඡා කල අතර, පොදු ප්‍රවාහන ක්ෂේත්‍රයේ නියැලෙන්නන් පුහුණු කරවීමට මොඩියුලයක් සකස් කිරීම පිළිබඳවද සාකච්ඡා කරන ලදි.





2019 මැයි මස 30 වන දින පවත්වන ලද සාකච්ඡාවේදී තීරණය කල පරිදි සකස් කිරීමට යෝජිත මොඩියුලය සම්බන්ධව අදහස් ලබා ගැනීම සඳහා 2019.6.20 දින පෙ.ව. 10.00 ට ජාතික කාන්තා කමිටු ශ්‍රවණාගාරයේදී සාකච්ඡාවක් පවත්වන ලදි. එහිදී, වීරසිංහම් මහතා විසින් පෙර සකසන ලද මොඩියුලයක් උපයෝගී කර ගනිමින් සාකච්ඡාව පැවැත් වූ අතර එම මොඩියුලය සකස් කිරීම පිළිබඳ පහත යෝජනා ඉදිරිපත් වූ අතර එම මොඩියුලය සකස් කිරිමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.

- මොඩියුලය සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ කරුණු ප්‍රමාණවත් නොවන බැවින් වැඩිදුර තොරතුරු අන්තර්ගත කිරීම
- අපේක්ෂිත පුහුණු වැඩසටහන් වඩාත් ගුණාත්මක කර ගැනීම සඳහා පුහුණු ක්‍රමවේද මොඩියුලය සඳහා අන්තර්ගත කිරීම